# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: **17/2016 (i)**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 දෙසැම්බර් මස 8වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම - 2016**

ඉහත කරුණ සම්බන්ධයෙන් වන 2016.12.05 දිනැති කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 17/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 ප්‍රකාරව, **2016 වර්ෂයට අදාළ අනුරූපී මූලික වැටුප සහ 2015.12.31 දිනට මූලික වැටුප අතර වෙනසට තුල්‍ය ප්‍රමාණය මත** විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ( UPF), සේවක භාරකාර අරමුදල ( ETF), සහ විශ්‍රාම වැටුප් අරමුදලට 2016.01.01 සිට 2016.11.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා දායක මුදල් ගණනය කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු බව තීරණය විය.

1) **දැනට සේවයෙහි නිරත සේවකයන් සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල**

අ) **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල** - විශ්‍රාම වැටුප් අරමුදල තෝරා නොගත් සේවකයන් නම් සේවා දායකත්වය වන 15% හෝ විශ්‍රාම වැටුප් හිමි සේවකයන් නම් 7% ගණනය කිරීමෙන් පසු 2016.01.01 සිට 2016.11.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙත බැර කළ යුතුය.

ආ) 2016.01.01 සිට 2016.11.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා අය කර ගත යුතු 10%ක මුළු සේවක දායක මුදල සළකනු ලබන සේවකයාගේ එකඟතාව සමඟ 2016 දෙසැම්බර් මාසයේ සිට ඇරඹෙන පරිදි උපරිමව මාස හයක (06) ක කාල පරිච්ඡේදයක් තුළ අදාළ සේවකයාගේ මාසික වැටුපෙන් අඩු කර ගත යුතුය.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / සළකනු ලබන උසස් අධ්‍යාපන ආයතනය මඟින් තීරණය කරන පරිදි පිළිගත හැකි වෙනත් යාන්ත්‍රණයකින්.

ඇ) **සේවක භාරකාර අරමුදල** - 3%ක දායකත්වය ගණනය කිරීමෙන් පසු 2016.01.01 සිට 2016.11.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් සේවක භාරකාර අරමුදල වෙත බැර කළ යුතුය.

2) **විශ්‍රාම ලැබූ/ ඉල්ලා අස් වූ / තනතුර අතහැර ගිය සේවකයන් සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල**

අ) **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල** - **විශ්‍රාම වැටුප් අරමුදලට සම්බන්ධ වී නොමැති සේවකයන් සඳහා**

සේවායයාගේ දායකත්වය වන 15% ගණනය කිරීමෙන් පසු ( 10% ක සේවකයාගේ දායක මුදල අඩු කර ගත නොහැකි නිසා) 2016.01.01 දින සිට රැකියාව නතර වූ දින දක්වා නියමිත මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් සළකනු ලබන සේවකයන් වෙත ගෙවිය යුතුය.

ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - <u>විශ්‍රාම වැටුප් අරමුදලට සම්බන්ධ සේවකයන් සඳහා</u>

සේව්‍යයාගේ දායකත්වය වන 07% ගණනය කිරීමෙන් පසු ( 10% ක සේවකයාගේ දායක මුදල අඩු කර ගත නොහැකි නිසා) 2016.01.01 දින සිට රැකියාව නතර වූ දින දක්වා නියමිත මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් සළකනු ලබන

සේවකයන් වෙත ගෙවිය යුතුය.

ඇ) සේවක භාරකාර අරමුදල - 3%ක දායකත්වය ගණනය කිරීමෙන් පසු 2016.01.01 දින සිට ඉහත සේවකයන්ගේ [(අ) සහ (ආ) කාණ්ඩ) ] රැකියාව නතර වූ දින දක්වා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් සේවක භාරකාර අරමුදල වෙත බැර කළ යුතුය.

3) <u>විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායකත්වය</u>

අ) <u>දැනට සේවයෙහි නිරත සේවකයන් සඳහා</u>

සේවකයන් දැනට සේවයෙහි නිරතව සිටී නම් සහ විශ්‍රාම වැටුප් අරමුදලට දායක වන්නේ නම් සේව්‍යයාගේ දායකත්වය වන 8% ගණනය කිරීමෙන් අනතුරුව 2016.01.01 සිට 2016.11.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා නියමිත මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් විශ්‍රාම වැටුප් අර අරමුදල වෙත බැර කළ යුතුය.

ආ) <u>විශ්‍රාම ලබා ඇති සේවකයන් සඳහා ( විශ්‍රාම වැටුප් හිමි)</u>

විශ්‍රාම වැටුප් හිමි විශ්‍රාම ලබා ඇති සේවකයන් නම් සේව්‍යයාගේ දායකත්වය වන 08% ගණනය කිරීමෙන් අනතුරුව 2016.01.01 දින සිට විශ්‍රාම ගැන්වූ දින දක්වා නියමිත මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් විශ්‍රාම වැටුප් අරමුදල වෙත බැර කළ යුතු අතර සළකනු ලබන සේවකයන්ගේ මාසික විශ්‍රාම වැටුප අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ගැළපිය යුතුය.

ඇ) <u>වසර 20ක සේවය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ලැබූ/ ඉල්ලා අස් වූ / තනතුර අතහැර ගිය සේවකයන් සඳහා</u>

වසර 20ක සේවය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ලැබූ/ ඉල්ලා අස් වූ / තනතුර අතහැර ගිය සේවකයන් නම් විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සේව්‍යයාගේ දායකත්වය වන 08% ගණනය කිරීමෙන් අනතුරුව 2016.01.01 දින සිට රැකියාව නතර වූ දින දක්වා නියමිත මුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය මඟින් සළකනු ලබන සේවකයන් වෙත අපසු ගෙවිය යුතුය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී අමතන්න - දු.ක අංක 011-2685511

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්